# පාචිත්තිය ශික්ෂා දුක්කට ආපත්ති වන අවස්ථා පිළිබඳ විමසීමක්

**පහලගම ධම්මික හිමි**[1]

## හැඳින්වීම

ථෙරවාද විනය පිටකයේ පාරාජිකපාළියේ හා පාචිත්තියපාළියේ දැක්වෙන ශික්ෂා පද අතර නිස්සග්ගිය පාචිත්තිය 30ක් හා පාචිත්තිය 92ක් අන්තර්ගත වේ. 'නිස්සග්ගිය' යන පදය අත්හැරීම, ඉවත දැමීම, හැරීම, දීම ආදි අර්ථවල යෙදෙයි. උපසම්පදා භික්ෂුවකට කැප නොවන යම් භාණ්ඩයක් හෝ දෙයක් ළඟ තබා ගැනීම හෝ භුක්ති විඳීම නිසා මෙම ඇවත සිදු වේ. සිවුරු, ඇතිරිලි හා පාත්‍රා ආදිය නියමිත දිනයට හෝ නියමිත ප්‍රමාණයට වඩා ළඟ තබාගෙන පරිහරණය කිරීමෙන් නිස්සග්ගිය පාචිත්තිය ආපත්තියට පත් වේ. පාචිත්තිය (සුද්ධ පාචිත්තිය) භාණ්ඩ ආදි වශයෙන් අත්හැරීම සිදු නො වෙයි. වචනයෙන් හෝ ක්‍රියාවෙන් සිදු වන වැරදි මෙම ආපත්තිවලට අයත් වේ. දැන දැන බොරු කීම, අපහාස කිරීම, ගස්වැල් සිඳීම ආදිය මේ සඳහා නිදසුන්ය. නිස්සග්ගිය පාචිත්තිය හා පාචිත්තිය ආපත්තිවලින් පිරිසිදුවීම ආකාර දෙකකට සිදු වේ. නිස්සග්ගිය පාචිත්තිය ආපත්තියකට පත් වූයේ නම් විනයානුකූල නොවන ආකාරයට ළඟ තබා ගත් භාණ්ඩ වෙනත් භික්ෂුවකට හෝ සංඝයා විෂයෙහි අත් හැර ආපත්ති දේශනය සිදු කළ යුතුය. පාචිත්තිය ආපත්තියක් සිදු වූ විට සංඝයා එක් භික්ෂුවක හෝ සංඝයා ඉදිරියේ ආපත්තිය පිළිගෙන ආපත්ති දේශනා කළ යුතුයි. පාචිත්තිය ශික්ෂා යම් අවස්ථාවක දුක්කට ආපත්ති බවට වන්නේ ද? යන පර්යේෂණ ගැටලු ව මත පිහිටා මෙම පර්යේෂණය සිදු කෙරේ.

## අරමුණ

පාචිත්තිය ශික්ෂාවේ ආපත්තිය සිදු නොවී දුක්කට ආපත්ති බවට පත්වීම පිළිබඳ විනයානුකූල විග්‍රහයන් පැහැදිලි කර ගැනීම හා එසේ සිදු වීමේ අවස්ථාව හඳුනාගැනීම පර්යේෂණයේ අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක ක්‍රමය යටතේ සිදු කරන පර්යේෂණයකි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් විනය පිටකයට අදාළ පාරාජිකපාළි හා පාචිත්තියපාළි ග්‍රන්ථ හා ඊට අයත් අට්ඨකථා හා ටීකා භාවිත කරන අතර ග්‍රන්ථ සන්ධාර ක්‍රමයෙන් දත්ත විශ්ලේෂණය සිදු වේ.

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, ශ්‍රී ලංකාව. pdhammika@busl.ac.lk

**ප්‍රතිඵල**

පාචිත්තියපාළියෙහි හඳුනාගත් පාචිත්තිය ශික්ෂා පද යම් අවස්ථාවක එහි අදාළ ආපත්තිය සිදු නොවී දුක්කට ආපත්ති බවට පත් වේ. ඒ සඳහා ඊට අදාළ ප්‍රයෝගය ප්‍රධාන වේ. අදින්නාදාන පාරාජිකාවට පූර්ව ප්‍රයෝග අවස්ථාවේ දී පාචිත්තිය සිදු වන අතර අදින්නාදානයට සහපයෝගවීමේ දී පාචිත්තිය දුක්කටාපත්ති බවට පත් වේ. පෙළෙහි පාචිත්තිය වශයෙන් හඳුනාගත්ත ද අවස්ථානුරූපී ව පාචිත්තිය දුක්කට වන ආකාරය මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් දැක්විය හැකි ය.

ක්‍රියාව සිදු කරන අවස්ථාව සහ උපසම්පදා භික්ෂුවගේ චේතනාව මත ආපත්තියක නෛතික ස්වභාවය විපර්යාසයට ලක් වන බව මෙම පර්යේෂණයෙන් පෙන්වා දිය හැකි ය. භූතගාම සහ පඨවි ඛණන සාමාන්‍ය අවස්ථාවල දී ස්වාධීන 'පාචිත්තිය' ආපත්ති වන නමුත් අදින්නාදාන පාරාජිකාව හා සම්බන්ධ වන 'භුම්මට්ඨකථා' න්‍යායේ දී ඒවායේ ස්වාධීනත්වය අහෝසි වේ. මෙහි දී තීරණාත්මක සාධකය වන්නේ භික්ෂුව ක්‍රියාත්මක වන 'ථෙය්‍ය චිත්තය' හෙවත් සොරකම් කිරීමේ චේතනාවයි. සොරකම සිදු කරන අවස්ථාවේ දී ම (සහපයෝග) නිධානයක් ලබාගැනීම උදෙසා කරනු ලබන ගස්වැල් කැපීම හෝ පොළොව සෑරීම, ප්‍රධාන වරදට උපකාරී වන සාධක (සහපයෝග) බවට පත්වන බැවින්, පාචිත්තිය ආපත්තිය 'සහපයෝග දුක්කට' බවට පත් වේ. අදින්නාදානයට පෙර සූදානම් වන (පුබ්බපයෝග) අවස්ථාවේ දී පාචිත්තිය සමඟ දුක්කටය ද්විත්වය ම සිදු වුව ද, සහපයෝග අවස්ථාවේ දී ථෙය්‍ය චිත්තයේ ප්‍රබලත්වය නිසා පාචිත්තිය යටපත් වී දුක්කටය පමණක් ඉතිරි වේ. මෙම න්‍යාය මුසාවාද ශික්ෂාපදයට ද එකසේ සාධාරණ වන බව පැහැදිලිය.

තව ද, බාහිර ක්‍රියාව කෙතරම් බරපතළ වුව ද චිත්ත සමුට්ඨානය රූප සමුදාය කුසල් සහගත වන විට නිධානය ගැනීමෙන් බුද්ධපූජා, ධම්මපූජා හා සංඝභත්ත ආදිය සිදු කිරීමේ චේතනාව ඇති වුව හොත් එය 'අනාපත්ති' වේ. මේ අනුව භික්ෂු විනය නීති පද්ධතිය යනු හුදෙක් බාහිර ක්‍රියා මත පමණක් තීරණය වන්නක් නොව ක්‍රියාවේ සන්දර්භය, චේතනාව සහ ස්වභාවය මත වෙනස් වන, අතිශය සූක්ෂ්ම වූ ශික්ෂා ව්‍යූහයක් බව නිගමනය කළ හැකි ය. පර්යේෂණාත්මක අගය ඉහළ නැංවීම සඳහා මෙම විනය න්‍යාය නූතන අපරාධ විද්‍යාවේ පූර්ව සූදානම සහ ක්‍රියාත්මක කිරීමේ අවස්ථා සමඟ සංසන්දනාත්මක ව හැදෑරීම අනාගත පර්යේෂකයන්ට විවෘත මාවතකි.

**සාකච්ඡාව හා නිගමනය**

උපසම්පදා භික්ෂුවකට ගස් සිඳීම පාචිත්තිය වේ ''*භූතගාම පාතව්‍යතාය පාචිත්තියං*'' (පාචිත්තියපාළි i, 2006: 106). එහෙත් මෙම පාචිත්තිය ශික්ෂාව අදින්නාදාන පාරාජිකාපත්තියට සහපයෝග අවස්ථාවේ දී දුක්කට බවට පත් වේ. අදින්නාදාන පාරාජිකාව නයමාතිකා ඔස්සේ සිදු කරන විග්‍රහයේ දී 'භුම්මට්ඨකථා' න්‍යායේ දී පුබ්බපයෝගය හා සහපයෝගය වශයෙන් අවස්ථා දෙකක් දැක්වේ. අදින්නාදානයට පෙර සිදු කරන දෑ පුබ්බපයෝගය නම් වේ. අදින්නාදානය වන අවස්ථාවේ සිදු කරන දෑ සහපයෝග නම් වේ. සහපයෝගයේ දී සිදු කරන ගස්වැල් සිඳීම දුක්කට ආපත්ති වේ. ''*තත්ථ ජාතකං කට්ඨං වා ලතං වා ඡින්දති, ආපත්ති දුක්කටස්ස*'' (පාරාජිකපාළි, 2005: 108). බොහෝ කාලයක් පොළොව යට තැම්පත් ව තිබූ නිසා නිධාන මත ගස් වැල්

පැළ වී තිබේ. ''*තත්ථජාතකන්ති චිරනිහිතාය කුම්භියා උපරි ජාතකං*'' (සමන්තපාසාදිකා i, 2014: 224) එනිසා 'ජාතකං' යනුවෙන් පෙළෙහි යෙදී තිබේ. නිධානය තිබෙන ස්ථානයේ දී එය ගැනීම සඳහා ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ගස්වැල් සිඳීම දුක්කට වේ. එය අදින්නාදාන පාරාජිකාවේ සහපයෝග අවස්ථාවයි. විනය අට්ඨකථාව අටාර දුක්කට විග්‍රයේ දී සහපයෝග දුක්කයට අදාළ ව ''යං කිඤ්චි අල්ලං වා සුක්ඛං වා තිණරුක්ඛලතාදිං ඡින්දන්තස්ස සහපයොගත්තා දුක්කටමෙව හොති'' (සමන්තපාසාදිකා i, 2014: 224) ''*තත්ථ ජාතකං කට්ඨං වා ලතං වා ඡින්දති, ආපත්ති දුක්කටස්ස ඉදං සහපයොගං*'' (සමන්තපාසාදිකා i, 2014: 225). වශයෙන් දක්වයි. මෙහි විශේෂත්වය නම් සහපයෝග අවස්ථාවයි. පාචිත්තිය ආපත්තියක් වුව ද අදින්නාදාන පාරාජිකාවේ සහපයෝගවීමයි. ''*එත්ථ පන පාචිත්තියවත්ථු ච දුක්කටවත්ථු ච දුක්කට්ඨානෙව තිට්ඨති*'' (සමන්තපාසාදිකා i, 2014: 225). පාචිත්තිය වුව ද දුක්කටයක් වුව ද දුක්කට ආපත්තියක් ම මෙහි දී මෙම ක්‍රියාව ම අදින්නාදාන පාරාජිකාවේ පුබ්බපයෝගයේ දී වෙනස් වේ. ''*සුක්ඛකට්ඨං ඡින්දති තච්ඡති ආකොටෙති සබ්බත්ථ හත්ථපදවාරෙසු දුක්කටං, අල්ලරුක්ඛං ඡින්දති පාචිත්තියං*'' (සමන්තපාසාදිකා i, 2014: 224). පාචිත්තිය ආපත්තිය දුක්කට වන්නේ අදින්නාදාන පාරාජිකාවේ සහපයෝගයේ දී ය. උපසම්පදා භික්ෂුවක විසින් පොළව යට ඇති නිධානයක් ගැනීම සිදු කරන අවස්ථාවක ගස්වැල්, තණ කොළ ආදිය සිඳීම, එබඳු අවස්ථාවක දී පාචිත්තිය ආපත්තිය දුක්කට වීම මෙයින් පැහැදිලි වේ.

උපසම්පදා භික්ෂුවක විසින් පොළව සෑරීම හෝ සෑරවීම පාචිත්තිය වේ. ''*යො පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං*'' (පාරාජිකපාළි, 2006: 102). අදින්නාදාන පාරාජිකාවේ දී සහපයෝග අවස්ථාව තුළ නිධානයක් ගැනීමට උත්සාහවත් වන භික්ෂුවක විසින් පොළොව සෑරිය යුතු ය. එසේ නොවන්නේ නම් කෙනෙකුලවා එය සිදු කරවා ගත යුතු යි. ඒ අවස්ථා දෙකේ දී ම පඨවි ඛණන පාචිත්තිය සිදු වෙයි. පොළොව සෑරීම යන ක්‍රියාව අදින්නාදානයට උපකාර වන ක්‍රියාවක් නිසා මෙහි ආපත්තිය සහපයෝග දුක්කට වේ. ''*අවහාරස්ස සහපයොගත්තාති*'' (සමන්තපාසාදිකා i, 2014: 225). එනම් පාචිත්තියක් නොවී දුක්කට ආපත්තියක් වීමයි. ''*අකප්පියපඨවිං ඛණන්තොපි හි ඉධ සහපයොගත්තා දුක්කටමෙව ආපජ්ජති*'' (සමන්තපාසාදිකා i" 2014: 225). අකැප පොළව සෑරීම ආදින්නාදානයේ දී සහපයෝග දුක්කට බවට පත් වේ.

උපසම්පදා භික්ෂුවකට ගස්වැල් සිඳීමත් පොළව සෑරීමත් පාචිත්තිය ආපත්ති වේ. අදින්නාදාන පාරාජිකාවට සහපයෝග වශයෙන් ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පාචිත්තිය ආපත්තිය දුක්කට වේ. අදින්නාදානය පුබ්බපයෝග අවස්ථාවේ දී භූතගාම පාචිත්තිය හා පඨවි ඛණන පාචිත්තිය සිදු වේ. එහි දී පාචිත්තියත් සමග දුක්කට ඇවත වේ. ''*පාචිත්තියට්ඨානෙ දුක්කටා න මුඤ්චති, පාචිත්තියෙන සද්ධිං දුක්කටමාපජ්ජති*'' යනුවෙන් වජිරබුද්ධි ටීකාව පැහැදිලි කරයි. පාචිත්තිය සිදු වන්නේ අදාළ ශික්ෂාව කැඩීමෙනි. දුක්කටය සිදුවන්නේ ථෙය්‍ය චිත්තය පවතින බැවිනි. මෙම පාචිත්තිය ආපත්තිය වීම සහපයෝගයේ දී වෙනස් වේ. භූතගාම, පඨවි ඛණන පාචිත්තිය දුක්කට බවට පත් වේ. එහි දී ථෙය්‍ය චිත්තය ප්‍රබල සාධකය වශයෙන් හඳුනාගත හැකි ය. එහි දී ඇති වන චිත්ත සමුට්ඨාන රූප සමුදාය හෙවත් අත්පා සෙළවීම්, කාය විකාර ආදිය සිදු වන්නේ අකුසල චිත්ත පාදක කොට ගෙනය. ඒ නිසා ආපත්තිය සිදු වේ. නිධාන ගැනීමේ ක්‍රියාව සිදු කරන සහපයෝග අවස්ථාවේ දී වුව ද කුසල චිත්තයෙන් ඇති වන

චිත්තසමුට්ඨාන රූප සමුදාය හේතුවෙන් අනාපත්ති වේ. ''*සචෙ පන කුසලචිත්තො පුඤ්ඤානි කරිස්සාමාති වදති අනාපත්ති*'' (සාරත්ථදීපනී i, 1914: 500). ථෙය්‍ය චිත්තය මුල් වීමෙන් අදින්නාදාන පාරාජිකාවේ දී පාචිත්තිය ආපත්තිය දුක්කට ආපත්ති බවට පත් වේ.

විනය ශික්ෂා අනුව බාහිර ක්‍රියාවේ ස්වරූපය එක ම වුව ද, එම ක්‍රියාව සිදු කරන අවස්ථාව (පුබ්බපයෝග/සහපයෝග) සහ භික්ෂුවගේ අභ්‍යන්තර චේතනාව (ථෙය්‍ය චිත්ත/කුසල චිත්ත) මත ආපත්තියේ බරපතලකම හා ආපත්ති විපර්යාසයට ලක් වන බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි ය.

අදින්නාදාන පාරාජිකාව වැනි මූලික ආපත්තියක් ඉලක්ක කරගත් සොරකම් කිරීමේ චේතනාව (ථෙය්‍ය චිත්තය) විසින් භූතගාම, පඨවිඛණන හා මුසාවාද වැනි පාචිත්තිය ආපත්තීන්හි කාර්යභාරය යටපත් කරනු ලබයි. එහි දී එම ක්‍රියා අදින්නාදාන පාරාජිකාවට උපකාර වන සාධක බවට පත්වන බැවින්, සහපයෝ අවස්ථාවේ දී ඒවා 'සහපයෝග දුක්කට' තත්වයට වේ. මේ හරහා බෞද්ධ විනය නීති පද්ධතිය යනු හුදෙක් බාහිර ක්‍රියාවන් මත පමණක් නොව, චිත්තවේගීය මුල්වීම් හා ක්‍රියාවේ අනුපූර්ව සන්දර්භය මත තීරණය වන අතිශය සූක්ෂ්ම, ප්‍රායෝගික සහ මනෝවිද්‍යාත්මක න්‍යාය පදනමක් සහිත නීති පද්ධතියක් බව පෙනේ.

අදින්නාදාන පාරාජිකාව පාදක කොට ගෙන මුසාවාදය සිදු විය හැකි ය. මුසාවාදය නම් ''*සම්පජාන මුසාවාදෙ පාචිත්තියං*'' (පාචිත්තියපාළි i, 2005: 4). දැන දැන බොරුකීම පාචිත්තිය ආපත්ති වේ. සහපයෝගයේ දී මුසාවාදයත් උක්ත න්‍යායෙන් දුක්කට ආපත්ති බව තේරුම් ගැනීම විනායානුකූලව වැරදි නොවේ.

**ප්‍රමුඛ පද** - උපසම්පදා භික්ෂුව, නිස්සග්ගිය, පාචිත්තිය, පුබ්බපයෝග, සහපයෝග

**ආශ්‍රිත ග්‍රන්ථ**

*පාචිත්තියපාළි,* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*පාරාජිකපාළි,* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*විමතිවිනොදනී.* (1935). කොළඹ: ලක්ෂ්මන් යන්ත්‍රාලය.

*සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා i.* (2014). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණ.

*සාරත්ථදීපනී i,* (1914). කොළඹ: විද්‍යාවිභූසන මුද්‍රණාලය.